**අයගම ප්‍රාදේශීය සභාව - 2020**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

අයගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**--------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
**-----------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල සිදුකල පිරිවැය රු. 1,966,209 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 03 ක් සහ සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් පිරිවැය රු. 349,800 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම රු. 22,977,117 ක් වුවද, එය රු. 16,541,898 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂය සඳහා වන ප්‍රාග්ධන ආදායම රු. 6,435,219 ක් අඩුවෙන්ද, ඌනතාවය ඒ හා සමාන ප්‍රමාණයකින් වැඩියෙන්ද දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධන ආදායම රු. 6,435,219 ක් අඩුවෙන් ගිණුම්ගත වීම සමුච්චිත අරමුදල හරහා නිවැරදි කර ලාභය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල ණයහිමි වෙන්කිරීම් රු. 235,000 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ මෙහෙයුම් වියදම සහ ඌනතාවය ඒ හා සමාන වටිනාකමකින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලද අත්තිකාරම් පියවීම සඳහා - මුද්දර ගාස්තු වලින් අඩුකරගෙන තිබූ රු. 494,312 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් හිඟහිටි මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය සහ ප්‍රධාන අමාත්‍යාංශ අත්තිකාරම් ගිණුමේ ශේෂය සමාන වටිනාකමකින් වැඩියෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී, නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම් වගකීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | පෙර වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.2 (ආ) යටතේ දක්වා ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමේදී රු. 1,900,000 ක් හිඟහිටි මුද්දර ගාස්තු ගිණුමට බැර කලයුතු වුවත්, සමුච්චිත අරමුදලට බැර කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය සහ සමුච්චිත අරමුදලේ ශේෂය ඒ හා සමාන වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී, නිවැරදි කිරීමට කටයුතු කරන බව. | හිඟහිටි මුද්දර ගාස්තු ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | පෙර වර්ෂවල සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති 05 කට අදාලව රැඳවුම් මුදල් සඳහා සමාලෝචිත වර්ෂය තුලද ණයහිමි වෙන්කිරීම් සිදුකිරීමෙන් වර්ෂයේ මෙහෙයුම් වියදම සහ ඌනතාව රු.689,434 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී, නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 110,289,521 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ගිණුම් ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, වගකීම් සහ ලෙජර් ගිණුම් ශේෂවල කාල විශ්ලේෂණයන් හා වටිනාකම් සනාථ වන සාක්ෂි පැවතිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,466,943 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,972,118 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | කාලීනව බදු අයකර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 186,953 ක් වූ හිඟ අක්කර බදු ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ඉඩම් හිමියන් හට සභාව වෙත පැමිණීමට නොහැකි වූ බැවින් ආදායම් ලැබීම අඩු වී ඇති බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 276,754 ක් වූ ජල බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් නියමිත ගාස්තු අය කිරීම ප්‍රමාද වූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා ලිපි මඟින් අදාල පුද්ගලයන් දැනුවත් කර ඇති බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. |
| **(ආ)** | **කුලී** | | |
| | එකතුව වර්ග අඩි 2077 ක් වූ අයගම සතිපොල කඩකාමර 16 ක් සහ කෘෂි බෝග අලෙවි මධ්‍යස්ථානයේ කඩකාමර සඳහා අයවිය යුතු පෙර ගෙවුම් මුදල් (Key Money) පිළිවෙලින් රු. 716,000 ක් සහ රු. 1,460,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 මාර්තු මස සිට කොරෝනා රෝගය ව්‍යාප්ත වීමත් සමඟ එම මුදල් අයකර ගැනීමට නොහැකි විය. කඩිනමින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයගම බස් නැවතුම්පල ඉහල මහල කඩකාමරය වර්ග අඩි 1743 ක් අයගම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා 2017 ජුලි 01 දින රු. 19,050 ක මාසික කුලී මුදලක් යටතේ බදු දී තිබුණු අතර, බදු ගිවිසුම් කාලය 2020 ජුනි 30 දිනෙන් අවසන් වී තිබුණි. ඉදිරි වසරක කාලය සඳහා ගිවිසුම අළුත්කිරීමට කටයුතු කර නොතිබුණු අතර, 2020 ජුලි සිට 2020 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් හිඟ කුලිය රු. 95,700 ක් 2021 අප්‍රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි. | අනුමැතිය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට යවා ඇති බවත්, අනුමැතිය ලද වහාම හිඟ මුදල් ගෙවීමට කටයුතු කරනු ලබන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

### 4.1 පාරිසරික ගැටලු

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 324 ක් පමණ බැහැර කිරීම සඳහා රු. 882,122 ක පිරිවැයක්, කාර්යය මණ්ඩල සේවකයින් 06 දෙනෙකු ද වාහන සහ යන්ත්‍ර උපකරණ 02 ක් ද යොදවා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් බැහැරව භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දැමීම මඟින් පාරිසරික ගැටළු රාශියක් මතුවී තිබුණි. | ප්‍රාදේශීය සභාව මඟින් මේ වනවිටත් කසළ බැහැර කිරීමට ඉඩමක් මිලදී ගැනීමට කටයුතු යොදමින් පවතින බවත් එය සිදුකර අවසන් වූ වහාම විධිමත් කසළ කළමනාකරණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරන බව. | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |